# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,721/2 — 1966 නොවැම්බර් 11 වැනි සිකුරාදා — 1966.11.11**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩි.—බී 31/47.

**මහ නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත**

(252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 10(2) වැනි වගන්තියෙන් හා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් ද තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 නොවැම්බර් මස 9 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

1. කුරුණෑගල මහා නගර සභාවේ දැනට නිලයේ සිටින සභිකයන්ගේ නිල කාලය අවසාන විය යුතු දිනය වශයෙන් 1966 දෙසැම්බර් මස 31 වැනි දිනය වෙනුවට 1967 දෙසැම්බර් මස 31 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

2. ඉහතකී මහා නගර සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීම පිණිස 1966 දෙසැම්බර් මස තිස්එක් වැනි දින හෝ ඊට පෙර මහා ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්‍යය සඳහා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත යටතේ මෙතෙක් කරන ලද සියලුම කටයුතු අවලංගු හා බලරහිත විය යුතුවාක් මෙන්ම, සියලු අවස්ථාවන්හිදී එසේ අවලංගු හා බලරහිතව ඇතැයි ද සැලකිය යුතුය.

3. ඉහතකී මහා නගර සභාවට සභිකයන් තෝරා පත් කර ගැනීම පිණිස 1966 දෙසැම්බර් තිස්එක් වැනි දින හෝ ඊට පෙර මහා ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්‍යය සඳහා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තවදුරටත් ක්‍රියා නොකළ යුතුය.

11-748


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණයකි

832/1——ආර් ආර් 18976—5,250 (66/11)